# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/09 - 2022 මාර්තු මස 28 වැනි සඳුදා - 2022.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

**පළාත් පාලන නිවේදනය**

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමඟ කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

බස්නාහිර පළාතේ, පළාත් පාලන කොමසාරිස් ඇල්වල දේවගේ ප්‍රභාත් ඉන්දික ප්‍රසන්න වන මම, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමඟ කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාත තුළ පිහිටියා වූ කටාන ප්‍රාදේශී සභාවෙහි පුරප්පාඩු වී ඇති උප සභාපති ධූරය සඳහා අළුත් උප සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා වන රැස්වීම 2022 ක් වූ අප්‍රේල් මස 12 දින පෙ.ව. 10.00 ට කටාන ප්‍රාදේශීය සභාව, දෙමංහන්දිය ලිපිනයෙහි පිහිටි කටාන ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව යන ස්ථානයේ දී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**ඒ. ඩී. පී. අයි. ප්‍රසන්න,**
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

2022 මාර්තු මස 28 වැනි දින,
බත්තරමුල්ල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි,
බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

EOG 03-1019

1A - PG 5793 — 15 (2022/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*